# භික්ෂුවකට පාවහන් පූජා කර නිවන තෙක් සුගතියේ

## උපාහනදායක ස්ථවිරවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 398 - 399)

භික්ෂූන් වහන්සේ නමකට පාවහන් යුගළක් පූජා කළ අයෙක් තමන් පැතූ පරිදි ම ගෞතම බුදු සසුනේ පැවිදි බව ලබා රහතන් වහන්සේ නමක් වූහ. එසේම කල්ප අනූ එකක් ම ඔහු සුගති සම්පත් ලැබුවේය. මේ ඒ පාවහන් පූජාවේ ආනිසංසයයි.